# බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

## 2016 මාර්තු මස 21 වන දින (සඳුදා) පෙ.ව. 9.30 ට

## න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

1. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2016-02-23 දින අසන ලද ප්‍රශ්ණය.

(ප්‍ර/ VI(I)/16/10)

(අ). 2015.12.31 වන විට කලාප හා පළාත් වශයෙන් ගුරු හා විදුහල්පති සේවාවල සිදු කරන ලද විනය පරීක්ෂණ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද?

(ආ). ඉන් මූලික විමර්ෂණ මතයැයි සඳහන් කරමින් ස්ථාන මාරුවීම් ලබා දී ඇති නිළධරයින්ගේ නාමලේඛණ හා ඊට අදාල දින වකවානු මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?

(ඇ). එම විනය පරීක්ෂණ පැවැත්වෙන නිළධරයන්ගෙන් මාස 03ක් ඉක්මවා තිබියදීත් චෝදනා පත්‍රයක් ඉදිරිපත් කිරීමට කටයුතු නොකළ නිළධාරීන් කවරේද?

(ඈ) ඒ පිළිබඳව වෙන් වෙන් වශයෙන් මෙම ගරු සභාවට කරුණු දක්වන්නේද?

2. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/ VI(I)/16/(17)

(අ) I. ගුරු හා විදුහල්පති සේවාවන්ට රජයේ අතිවිශේෂ ගැසට් පත්‍ර මගින් නව සේවා ව්‍යවස්ථාවන් හඳුන්වා දී ඇති බව ඔබතුමා පිළිගන්නේද?

II. ඒ සඳහා මේ වන විට කොපමණ කාලයක් ගත වී තිබේද?

(ආ) I. එම නව සේවාවන්ට සේවයේ නියුතු ගුරුවරුන් හා විදුහල්පතිවරුන් පළමුව අන්තර්ග්‍රහණය කිරීමටත් පසුව නියමිත උසස්වීම් හා හිඟ වැටුප් ලබා දීමටත් කටයුතු කළ යුතු බව ඔබතුමා දන්නෙහිද?

II. ඒ සඳහා ඔබතුමාගේ අමාත්‍යාංශයට අයත් ආයතන කටයුතු කර තිබේද?

III. ඒ එක් එක් සේවාවන්ට අදාලව බස්නාහිර පළාතේ කලාප වශයෙන් සංඛ්‍යා ලේඛණ හා ගෙවීම් කරන ලද හිඟ වැටුප් ප්‍රමාණයන් මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?

IV. උක්ත කටයුතු අවසන්ව නැති නම් ඒ ඒ සේවාවන්ට අදාලව කලාප වශයෙන් පවතින ගැටළු හෝ ඊට අදාල සංඛ්‍යා ලේඛණ හා නොගෙවා ඇති හිඟ වැටුප් ප්‍රමාණයන් මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?

V. මෙම සියළු ගැටලු විසඳාගනිමින් ගුරුවරුන් හා විදුහල්පතිවරුන් නව සේවාවන්ට අන්තර්ග්‍රහණය කිරීම හා උසස් වීම් ලබා දීම් අවසන් කර හිඟ වැටුප් ගෙවීම සඳහා තවත් කොපමණ කාලයක් අවශ්‍යද? යන්න මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?

3. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/ VI(I)/16/18)

(අ) I. බස්නාහිර පළාතේ අධ්‍යාපන කලාප කාර්යාලයන්හි සම්බන්ධීකරණ නිලධාරී වශයෙන් නීත්‍යානුකූල තනතුරක් ක්‍රියාත්මක වන්නේද?

II. ක්‍රියාත්මක වන්නේ නම් කවදා සිටද?

→

(ආ) I. එම තනතුර ස්ථාපිත කිරීම සම්බන්ධව පවත්නා නීත්‍යානුකූල තත්වය කුමක්ද?

II. ඔවුන්ට පැවරී ඇති රාජකාරී මොනවාද?

III. මෙම තනතුරට බඳවා ගෙන ඇත්තේ කවර සේවාවකින්ද? ඒ කවර පදනමකින්ද?

(ඇ) මේ වන විට එම තනතුරේ නිලධාරීන් කීදෙනෙකු සේවයේ යෙදී සිටින්නේද? ඔවුන් කවරෙක්ද? යන්න, මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?

4. ගරු අශෝක රන්වල මන්ත්‍රීතුමා විසින් ගරු කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට: (ප්‍ර/ VI(I)/16/19)

(අ) ගම්පහ සහ කොළඹ දිස්ත්‍රික්ක මායිම් කරමින් කි.මී 40 කට වැඩි දුර ප්‍රමාණයක් ගෙවමින් ගලා යන කැළණි ගඟෙහි වම් සහ දකුණු ඉවුරු ආශ්‍රිතව එම දිස්ත්‍රික්ක තුළ පවතින පොදු කොටුපල සංඛ්‍යාව කොපමණද?

(ආ) එම කොටුපල නාම ලේඛණය මෙම සභාවට ඉදිරිපත් කළ හැකිද?

(ඇ) කැළණි ගඟ වෙත ගමන් කරනු ලබන ඇළ වේලි සංඛ්‍යාව (ගම්පහ සහ කොළඹ දිස්ත්‍රික්ක බල ප්‍රදේශයන්ට අදාලව) කොපමණද?

(ඈ) එම ඇළ වේලි නාම ලේඛණය මෙම සභාවට ඉදිරිපත් කළ හැකිද?

5. ගරු කිත්සිරි කහටපිටිය මන්ත්‍රීතුමා විසින් ගරු ධීවර, මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත සහ ග්‍රාම සංවර්ධන පිළිබඳව අමත්‍යතුමාගෙන් ඇසීමට: (ප්‍ර/ VI(I)/16/20)

(අ) මඳුරාවල සමුපකාර සමිතියට ඉන්දන පිරවුම් හලක් ලබා දීම සඳහා "නිව් එැටල් වතුයායේන් ඉඩමක් වෙන් කර ඇති බව ඔබතුමා දන්නෙහිද?

(ආ) එම ඉන්ධන පිරවුම් හල තැනීමට මුල් ගල තබා ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට සකස් කළ බව ඔබතුමා දන්නවාද?

(ඇ) එය අතර මග නතර වී ඇත්තේ කුමන හේතුවක් නිසාද?

(ඈ) එම ඉන්දන පිරවුම් හල ඉදිකරන්නේ නම් එය ප්‍රදේශවාසීන්ට සේවාවක් වන අතර සමූපකාර සමිතියට ආදායම් ඉපයීමේ මාර්ගයක් බව ඔබ තුමා දන්නෙහිද?

(ඉ) එම ව්‍යාපෘතිය ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ග මොනවාද ?

6. ගරු ජේ. ඒ. රොයිස් විජිත ප්‍රනාන්දු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නිතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට: (ප/ VI(I)/16/21)

(අ) මීගමුව "කාමච්චෝඩේ සතිපොල" ආර්ථික සංවර්ධන අමාත්‍යාංශීය මුදල් යොදා අළුතින් ගොඩනැගිලි ඉදිකිරීමට බස්නාහිර පළාතේ පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය කටයුතු කළ බව ඔබතුමා දන්නවාද?

(ආ) මීගමුව කෙලින් වීදියේ සිට මුහුදු වෙරළටද, කාමච්චෝඩේ හා වැල්ලවීදිය ග්‍රාම වලටද ප්‍රධාන ප්‍රවේශ මාර්ගය ලෙස වසර 150 කට අධික කාලයක් භාවිතා කළ මීගමුවට සුවිශේෂිත ගරු විස්තිර්නි පියතුමා සිහිවීම සඳහා නම් කළ "විස්තිර්නි පාර" සම්පූර්ණයෙන් වසා දමා එම මාර්ගය මැද නව ගොඩනැගිලි ඉදිකිරීම් නිත්‍යානුකූලද?

(ඇ) මෙම ගොඩනැගිලි තවමත් භාවිතයට නොගෙන ඒ අවට පිහිටි මංමාවත් පුරා සතිපොළ පවත්වාගෙන යනු ලබන්නේ ඇයි?

(ඈ) මෙම නව ගොඩනැගිලි හා මාර්ග පිළිසකර කිරීමට කොපමණ මුදලක් වැය කර තිබේද?

(ඉ) "කාමච්චෝඩේ සතිපොල ගොඩනැගිලි" හා භූමි සංවර්ධන ව්‍යාපෘතියට මීගමුව මහනගර සභාව යොදා නොගැනීමට හේතු මොනවාද?

(ඊ) යම් ඉදිකිරීමක් සඳහා අදාල පළාත් පාලන ආයතනයේ අනුමැතිය නොමැතිව කටයුතු කිරීමට යම් අමාත්‍යාංශයකට හෝ පළාත් සභාවක අධිකාරියකට හැකියාවක් තිබෙනවාද?

7. ගරු ජේ. ඒ. රොයිස් විජිත ප්‍රනාන්දු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, ඉංජිනේරු සේවා, නිතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බල ශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට.' (ප්‍ර/ VI(I)/16/22.)

(අ) බස්නාහිර පළාත් සංචාරක අමාත්‍යාංශය සතුව මීගමුව ඒත්තුකාල මුහුදු වෙරළේ පිහිණුම් තටාකයක් ඇති බව ඔබතුමා පිළිගන්නවාද?

(ආ) මීගමුව මුහුදු වෙරළේ පිහිණුම් තටාකයක් ඉදිකිරීම සම්බන්ධව මීගමුව මහනගර සභාව, නාගරික සංවර්ධන අධිකාරිය, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා මධ්‍යම පරිසර අධිකාරිය ඉදිකිරීම් සඳහා අවශ්‍ය අවසරය දී තිබේද?

(ඇ) මෙම පිහිණුම් තටාකය පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරිය (බ.ප) විසින් නිම කර බස්නාහිර පළාත් සංචාරක අමාත්‍යාංශයට භාර දී ඇත්තේ කවදාද?

(ඈ) එම පිහිණුම් තටාකය ඉදිකිරීමට කොපමණ මුදලක් වැය වී තිබේද?

(ඉ) එම පිහිණුම් තටාකය දැනට පවත්වාගෙන යන්නේ කවුරුන් විසින්ද?

(ඊ) එම පිහිණුම් තටාකය දැනට පවත්වාගෙන යන අයට එය ලබා දී ඇත්තේ ටෙන්ඩරයක් මගින්ද?

(උ) එම ටෙන්ඩරය පිළිබඳව ප්‍රසිද්ධ පුවත්පත් මගින් දැන්වීම් පලකර තිබුණාද? ඒ කවරදා ද? කිනම් පුවත්පත් වලද?

(ඌ) ටෙන්ඩර්කරුවන් කී දෙනෙක් ඉදිරිපත්ව තිබුණාද?

(එ) එම ටෙන්ඩර්කරුවන් අතරින් තෝරා ගන්නා ලද්දේ කවුරුන්වද? කවදාද?

(ඒ) බස්නාහිර පළාත් සභාවේ සංචාරක අමාත්‍යාංශය සතුව මීගමුව ඒත්තුකාල මුහුදු වෙරළේ පිහිණුම් තටාකය පවත්වාගෙන යාම සම්බන්ධව කොන්දේසි අඩංගු ගිවිසුමක් තිබේද? කා සමගද?

(ඔ) එම ගිවිසුම් කාලය නිමවන්නේ කවදාද?

8. ගරු කේ. ඩී. අරුණ දීපාල් මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු, සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට: (ප්‍ර/ VI(I)/16/'23)

(අ) බණ්ඩාරගම අධ්‍යාපන කොට්ඨාශයේ පාසල් සඳහා අවශ්‍ය සම්පූර්ණ මුරකරුවන් (දිවා/රාත්‍රී) ගණන කොපමණද? දැනට සිටින සංඛ්‍යාව කොපමණද?

(ආ) රාත්‍රී කාලයේ පමණක් මුරකරුවන් ලෙස සේවයේ යොදවා ඇති අයගේ නම් එක් එක් පාසල අනුව ඉදිරිපත් කළ හැකිද? එසේ නම් ඒ කවුරුන්ද?

(ඇ) දිවා කාලයේ පමණක් මුරකරුවන් ලෙස සේවයේ යොදවා ඇති අයගේ නම් එක් එක් පාසල අනුව ඉදිරිපත් කළ හැකිද? එසේ නම් ඒ කවුරුන්ද?

(ඈ) වැඩමුර මාරුවීමේ ක්‍රමයට දිවා/රාත්‍රී දෙක සඳහාම මුරකරුවන් ලෙස සේවයේ යොදවා ඇති අයගේ නම් එක් එක් පාසල අනුව ඉදිරිපත් කළ හැකිද? එසේ නම් ඒ කවුරුන්ද?

(ඉ) ඉහත සඳහන් රාත්‍රී මුරකරුවන්ගේ රාජකාරි නිසි පරිදි ඉටු කරන්නේද? යන්න පරීක්ෂා කිරීමේ යම් ක්‍රම වේදයක් වේද? එසේනම් එය කුමක්ද?

(ඊ) මුරකරු තනතුර සඳහා බඳවා නොගත් වෙනත් තනතුරක් සඳහා බඳවා ගත් අයවළුන් මුරකරු රාජකාරියේ යොදවා ඇත්ද? එසේ නම් ඒ කවුරුන්ද?

9. ගරු කේ. ඩී. අරුණ දීපාල් මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු, සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට: (ප්‍ර/ VI(I)/16/24)

(අ) පළාත තුළ ගුරුවරුන්ගේ විනය විරෝධී ක්‍රියා සම්බන්ධයෙන් ක්‍රියාකරනු ලබන්නේ කුමන පනතක, ප්‍රඥප්තියද, රෙගුලාසියක හෝ ආචාර ධර්ම පද්ධතියක් හෝ වෙනත් පොදු නීති මාලාවක් යටතේද? එසේනම් එය කුමක්ද?

(ආ) යම් ගුරුවරයෙකු සම්බන්ධයෙන් විනයානුකූලව ක්‍රියාකිරීමට නම් ඉහත සඳහන් නීතියක් හෝ රෙගුලාසියක් හෝ ආචාර ධර්ම පද්ධතියක් කඩ කර තිබිය යුතු බව ඔබතුමා පිළිගන්නේද?

(ඇ) යම් ගුරුවරයෙක්, යම් දරුවෙකුගේ, දෙමව්පියන්ගේ කැමැත්ත මත පාසල වෙත පැමිණීම සඳහා ප්‍රවාහන පහසුකම් සැලසීම, විනය විරෝධී ක්‍රියාවක් වේද? එසේ නම් ඒ ඉහත කුමන නීතියක් යටතේද?

(ඈ) ගුරුවරයෙකු සමග දරුවෙකු පාසල වෙත පැමිණීම මගින් එම දරුවාගේ අනාගත චර්යා ගැටළු ඇති විය හැකිද? එසේ නම් ඒ කුමන ආකාරයෙන්ද?

(ඉ) බයිසිකලයක ගමන් කළ හැකි උපරිම සංඛ්‍යාව ඔබතුමා දන්නේද? එම සංඛ්‍යාව දෙදෙනෙකුට වඩා වැඩිපුර රැගෙන යාම සඳහා අවසර දීමට හෝ අනුබල දීමට පළාත් අධ්‍යාපන සේවයේ යම් නිලධාරියෙකුට බලය පවරා ඇත්ද? එසේ නම් ඒ කවුරුන් හටද?

(ඊ) යම් නිලධාරියෙකු ගුරුවරයෙකුගේ විනය සම්බන්ධයෙන් අත්තනෝමතිකව නීතියට පටහැනිව ක්‍රියාකර ඇත්නම් එම නිලධාරියා/නිලධාරීන් සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද?

10. ගරු නන්දන පත්ම කුමාර මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු, සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට: (ප්‍ර/ VI(1)/16/25)

(අ) I. බස්නාහිර පළාතේ ද්විතීයික පාසල් 1000 ව්‍යාපෘතියට ඇතුලත් කරන ලද පාසල් ප්‍රමාණය කොපමණද?

II. ඒ කුමන පාසල්ද?

(ආ) I. එම පාසල් සඳහා ද්විතීයික පාසල් 1000 ව්‍යාපෘතිය නිසාම ලැබූ සංවර්ධන ව්‍යාපෘති මොනවාද?

II. එම සෑම ව්‍යාපෘතියක්ම සිදු අයිතියට පත් කර තිබේද?

III. නොඑසේනම් ඒ මන්ද?

(ඇ) I. මෙම ද්විතීයික පාසල් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී අසාර්ථක පාසල් තිබෙන බව ඔබතුමා දන්නේද?

II. ඒ කුමන පාසල් ද?

III. ඒ පිළිබඳව ඔබතුමා ගන්නා පියවර කවරේද?

11. ගරු එම්. රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු, සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට: (ප්‍ර/ VI(1)/16/26)

(අ) I. බස්නාහිර පළාත තුළ කැළණිය හා මීගමුව අධ්‍යාපන කලාප සඳහා පත්කර ඇති අධ්‍යක්ෂකවරුන්ගේ නම් මොනවාද?

II. ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම් මොනවාද?

(ආ) මෙම කලාප තුළ දැනට සේවයේ නියුතු ඉහත අධ්‍යක්ෂකවරුන්ට වඩා ශ්‍රේණියෙන් ඉහළ අධ්‍යාපන සුදුසුකම් ඇති අය කී දෙනෙකු සිටින්නේද?

(ඇ) ඔවුන්ගේ නම් කවරේද?

(ඈ) තනතුරට අදාල අධ්‍යාපන සුදුසුකම් අඩු තැනැත්තන් විසින් ඉහත තනතුරු වල වැඩ බලන බව ඔබතුමා දන්නේද?

(ඉ) නියම අධ්‍යාපන සුදුසුකම් ඇති තැනැත්තන් එකී තනතුරු වලට පත් කර පසුගිය සමයේ වූ වැරදි නිවැරදි කිරීමට ඔබතුමා පියවර ගන්නේද?

(ඊ) නොඑසේනම් ඒ මන්ද?

12. ගරු එම්. රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු, සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට: (ප්‍ර/ VI(I)/16/27)

(අ) මීගමුව අධ්‍යාපන කලාපය තුළ පිහිටි සීදුව දවිසමර විදුහලේ අර්බුදය පිළිබඳව ඔබතුමා දන්නේද?

(ආ) නගර සභා අරමුදලින් රුපියල් ලක්ෂ පහළොවක් වෙන්කොට ගෙන ජෙයරාජ් ප්‍රනාන්දු පුල්ලේ පදනමින් පොත් බෙදා දෙන බවට ප්‍රචාරය කර පවත්වන ලද උත්සවයේදී ඇති වූ ගුරු, දෙමාපිය, නිලධාරි, ගැටුම ඔබතුමා දන්නේද?

(ඇ) එකී සිද්ධිය පදනම් කරගෙන පාසල නගා සිටුවීමට දායක වූ විදුහල්පතිවරයා දේශපාලන චූවමනාවක් මත මාරු කිරීමට කටයුතු කර ඇත්තේ මන්ද?

(ඇ) පාසල් වලට දේශපාලන බලපෑම් කිරීම නැවැත්වීමට ඔබතුමා පියවර ගන්නේද?

(ඉ) ගම්බද පාසල් නගා සිටුවන ක්‍රියාශීලි විදුහල්පතිවරුන්ට බලපෑම් වලින් තොරව සේවය කිරීමට අවශ්‍ය වාතාවරණය ඔබතුමා ඇති කරන්නේද?

(ඊ) නොඑසේනම් ඒ මන්ද?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

## XI. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

**01. ගරු මහේෂ් අල්මේදා මන්ත්‍රීතුමා:**

බස්නාහිර පළාත තුළ වතු ආශ්‍රිතව විශාල ජනතාවක් ජීවත් වන අතර, ඔවුන්ගේ දරුවන්ගේ අනාගතය යහපත් කිරීමේ සහ ඔවුන් මෙරට ආර්ථිකයේ ශක්තිමත් කොටස්කරුවන් බවට පත් කිරීමේ අරමුණෙන් වතු පාසල් විශාල සංඛ්‍යාවක් පිහිටුවා ඇත. මෙම වතු පාසල්වල දරුවන්හට අධ්‍යාපනය නිසි පරිදි ලබාදීමට පහසුකම් රැසක් ස්ථාපිත කර ඇතත්, ඔවුන්ට අධ්‍යාපනය ලබාදෙන ගුරුවරුන්ට දුෂ්කරතා රැසකට මුහුණදීමට සිදුව ඇත.

එම ගුරුවරුන් පත්වන දුෂ්කරතාවයන් අතර පාසලට ළඟාවීමට ඇති ප්‍රවාහන අපහසුතාවය ප්‍රධානතම කරුණක් වන අතර, එයට විසඳුමක් ලෙස බස්නාහිර පළාතේ සේවය කරනු ලබන සියලු වතු පාසල්වල විදුහල්පතිවරුන් සහ ගුරුවරුන්ට ප්‍රවාහන පහසුකම් සලසා ගැනීම සඳහා බස්නාහිර පළාත් සභාවේ මැදිහත්වීමෙන් යතුරු පැදියක් ලබාදීමට කටයුතු කිරීම සුදුසු යැයි මෙම පළාත් සභාව අදහස් කරයි.

(යෝ/VI (1) /14/14)

**02. ගරු එම්. රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය:**

විවිධ නම්, විවිධ වැඩසටහන් හඳුන්වා දෙමින් ක්‍රම ක්‍රමයෙන් ගම්බද පාසැල් වසා දැමීම මගින් ගම තුළ අඩු ආදායම්ලාභී පවුල්වල ජන්ම ලාභී දක්ෂ දරුවන්ට මනා පාසැල් අධ්‍යාපනයක් ලබා ගැනීමට ඇති අයිතිය අහිමි වෙමින් පවතී. ගම්බද පාසැල් වැසියාමෙන් වාහන මගින් දුරින් පිහිටි පාසැල් වලට යා නොහැකි ශිෂ්‍යයන් පාසැල් අධ්‍යාපනයෙන් සමුගන්නා ප්‍රවණතාවයක්ද දක්නට ඇත. එම හේතුවෙන් දෙමාපියන්ද දුෂ්කරතා රාශියකට මුහුණ දී ඇත. එහෙයින් ගම්බද පාසැල් සඳහා යලි පහසුකම් ලබා දී ගම්බද සිසුන්ගේ අධ්‍යාපන අයිතිය සුරක්ෂිත කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි

(යෝ/VI (1) /15/01)

## XII. සභාව කල් තැබීම

කේ.එච්.ඩී.කේ. සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2016.03.09 දින
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.